# PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.

சுதந்திரமானதும் நீதியானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

**PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS**

## 2011 මාර්තු 17 පළාත් පාලන මැතිවරණයේ පැෆ්රල් මැතිවරණ දින වාර්තාව

පළාත් පාලන ආයතන 234 ක් සඳහා අද දින පවත්වන ලද මැතිවරණය සාමකාමී වාතාවරණයක් තුළ පැවැතියද, සමස්තයක් වශයෙන් ඡන්ද නීති උල්ලංඝණය කිරීම් නිරීක්ෂණය විය. විශේෂයෙන්ම පූර්ව මැතිවරණ කාලය තුළ ද මෙම තත්ත්වයෙහි වෙනසක් නොවුන බව සඳහන් කළ හැක. පසුගිය පළාත් පාලන මැතිවරණය හා සංසන්දනයේදී මෙවරත් ඡන්ද ප්‍රකාශිත ප්‍රතිශතය 55-60% ත් අතර ප්‍රතිශතයක් විය. සභිකයන් 3022 ක් තෝරා ගැනීම සඳහා අපේක්ෂකයන් 29108 ක් මෙවර මැතිවරණයේදී තරඟ කරන ලදී. ඡන්ද දායකයින් මිලියන 9.4 ක් ඡන්දය ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා සුදුසුකම් ලැබූහ.

පැෆ්රල් සංවිධානය ස්ථානගත නිරීක්ෂකයින් 3500 ක් හා ජංගම නිරීක්ෂණ කණ්ඩායම් 125 ක් නිරීක්ෂණයෙහි යොදවන ලදී. එම නිරීක්ෂණයට අනුව අද දින සිදුවීම් 72 ක් වාර්තා වූ අතර, ඉන් බරපතල සිද්ධීන් 06 ක් සිදුවූ බව වාර්තා වී ඇත. දඹුල්ල ප්‍රදේශයේ වූ සිද්ධියකින් පුද්ගලයන් දෙදෙනෙකු බරපතල තුවාල ලබා රෝහල් ගතකර ඇත. පෙරවරු 3.00 ට පමණ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මගුල්දමන ඡන්ද මධ්‍යස්ථානයේ බෝම්බ ප්‍රහාරයක් එල්ල වීමෙන් පොලිස් නිලධාරියකු තුවාල ලබා ඇත.

පූර්ව මැතිවරණ සමයේදී ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවූ ස්ථාන බවට හඳුනාගත් ප්‍රදේශවලම අද දිනද මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සහ ඡන්ද නීති උල්ලංඝණ ය කිරීම් සිදුවූ බව වාර්තා විය. මාතර, තංගල්ල, බේරුවල, අක්කරෙයිපත්තු, කැළණිය, බියගම, නාවලපිටිය හා දඹුල්ල යන ප්‍රදේශ මෙම සිද්ධීන් වාර්තා වූ ප්‍රදේශ ලෙස දැක්විය හැක. මීට අමතරව නීති විරෝධී ලෙස ඡන්ද දායකයින් ප්‍රවාහනය කළ ස්ථාන පිළිබඳව ද අපට වාර්තා වී ඇත. ඒවා නම් පුත්තලම දිස්ත්‍රික්කයේ කරුවලගස් වැව සහ ආරච්චිකට්ටුව යන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය, මන්නාරම, මොණරාගල, මුලතිව්, ගාල්ල දිස්ත්‍රික්කයේ ඉමදුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය, ත්‍රිකුණාමලය හා අම්පාර යන ප්‍රදේශ වේ.

ඡන්ද අපේක්ෂකයන් මැතිවරණ නීති ආරක්ෂා නොකිරීම හා මැතිවරණ කොමසාරිස් වරයා විසින් පනවන ලද රෙගුලාසි නොතැකීම සියළුම මැතිවරණවල ප්‍රධාන ගැටළුව බව පැෆ්රල් සංවිධානය අවධාරණය කරයි. මෙයට අමතරව අනෙක් ප්‍රධාන ගැටළුව වන්නේ රාජ්‍ය මාධ්‍ය මැතිවරණ නීති උල්ලංඝණය කරමින් රජයට පක්ෂ ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීමේ නියැළුණු බව පැෆ්රල් සංවිධානයට වාර්තා විය.

නීති උල්ලංඝණය කරන අයට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන ආයතන තුළ ඇති මන්දගාමී ස්වභාවය හා නීතිය නිසි ලෙස ක්‍රියාත්මක නොකිරීම නිසා නීති උල්ලංඝණය කරන්නන්ට තමන්ට රිසි සේ නීති කැඩීමට අවස්ථාව සැලසුණ බවද කණගාටුවෙන් වුවද සඳහන් කළ යුතුය.

ඡන්දයේදී සැලකිය යුතු අන්දමින් ඡන්දය ප්‍රකාශ කරමින් ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම සඳහා දැක්වූ දායකත්වය පිළිබඳව අපගේ ප්‍රණාමය පුදකරන අතර මෙය තවදුරටත් වර්ධනය විය යුතු බවද සඳහන් කරමු.

නීති ප්‍රකාරව සේවා දායකයින් තම සේවකයින්ට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා නිවාඩු අනුමත නොකිරීම සම්බන්ධයෙන් පැෆ්රල් සංවිධානයට පැමිණිලි ලැබී ඇත. ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රම වේදයේ වෙනසක් සිදුකළ යුතු බව අපි තදින් විශ්වාස කරන අතර ඡන්ද නාම ලේඛණ නිවැරදිව යාවත්කාලීන කිරීම ද වැදගත් කරුණක් බව අප අවධාරණය කරමු. බොහෝ අවස්ථාවලදී මැතිවරණ කොමසාරිස් තුමා යම් යම් ක්‍රියාමාර්ග ගත්තේ වී නමුත් ඒවා ක්‍රියාත්මක වීම පිළිබඳ පසු විපරම් කිරීමට නෛතික බලයක් නොමැතිවීම බලවත් අඩුපාඩුවක් වූ බැවින් බලවත් ශක්තිමත් හා ස්වාධීන මැතිවරණ කොමිෂන් සභාවක් ස්ථාපිත කිරීම වැදගත් බව අපි දැඩි සේ අවධාරණය කරමු.

රෝහණ හෙට්ටිආරච්චි

විධායක අධ්‍යක්ෂ

# 12/3, Robert Terrace, Robert Gunawardana Mawatha, Colombo 6, Sri Lanka.
Tel : (+94) 11 2514441, 11 2514442 Fax : (+94) 11 2514443
E-mail : paffrel@sltnet.lk Website : www.paffrel.lk